**රාජ්‍ය ආයතනවල අතිරික්ත භාරකාර අරමුදල**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2011 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව අදහස් දැක්වීම්

#### 1.2.1 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2005 අගෝස්තු 03 දින අත්සන් තැබුණු භාරකාර අරමුදලේ ප්‍රතිඥා පත්‍රයේ 12 වන වගන්තියේ (අ) ඡේදය අනුව,

භාරකාර මණ්ඩලය අවම වශයෙන් මාස 03 කට වරක්වත් රැස්විය යුතුය. නමුත්, සමාලෝචිත වර්ෂය තුළ එසේ රැස්වී ඇත්තේ එක් වරක් පමණි.

(ආ) 2006 ජූනි 27 දිනැති අවබෝධතා ගිවිසුමේ අයිතම 06 ට අනුව භාරකාර අරමුදලට සහභාගීවන එක් එක් රාජ්‍ය ආයතන විසින් අවම වශයෙන් මාස 06 ක ප්‍රක්ෂේපිත අරමුදල් ප්‍රවාහ විස්තර අරමුදල් කළමනාකරු වෙත සැපයිය යුතු යැයි ඉල්ලීම් කළ යුතු වේ. නමුත්, කිසිදු ප්‍රක්ෂේපිත අරමුදල් ප්‍රවාහයක් සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් කළමනාකරු වෙත ලැබී නොතිබුණි.

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, අරමුදලේ මෙහෙයුම් පසුගිය වර්ෂයේ දළ ආදායම වූ රු. මිලියන 2801.9 ට සාපේක්ෂව රු. මිලියන 1457.5 ක දළ ආදායමක් සමාලෝචිත වර්ෂය තුළ උත්පාදනය කර තිබූ අතර, එය පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 1344.4 ක හෙවත් 47.98% ක අඩුවීමකි. භාරකාර අරමුදලේ ප්‍රාග්ධනය 2010 වර්ෂයේදී ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම හා පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉහළ ඉපයීම් ඇති බැඳුම්කර සඳහා වූ පොලී අනුපාතය පහළ යාම මෙම අඩුවීමට හේතුවී ඇත.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිලාභීන් 4 දෙනෙකු පමණක් රු. මිලියන 3,329 ක් භාරකාර අරමුදලේ තැන්පත් කර තිබුණු අතර, ප්‍රතිලාභීන් 7 දෙනෙකු රු. මිලියන 4,505.6 ක මුදලක් ආපසු ගැනීම් කර තිබුණි.

(ඇ) 2010 අගොස්තු මස ප්‍රතිලාභීන්ගේ ආයෝජනවලින් 40% ක මුදලක් (රු. බිලියන 6,109) ඒකාබද්ධ අරමුදලට මාරුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස, 2010, ජනවාරි 01 පැවති රු.බිලියන 17.812 ක් වූ අරමුදල් පදනම 2011 ජනවාරි 01 රු.බිලියන 10.845 ක් දක්වා අඩු වී ඇත. නමුත්, 2011 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන 19 විසින් ආයෝජනය කළ මුදල රු.බිලියන 11.786 ක් වූ අතර, එය පෙර වර්ෂයට සාපේක්ෂව 8.7% ක වැඩිවීමකි.

(ඈ) අරමුදලේ ප්‍රධානතම ආදායම් මාර්ගය වන ආයෝජන ශේෂය පෙර වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 519.4 කින් අඩුවී ඇත.

**3. පද්ධති හා පාලන**

**--------------------**

පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරහි විශේෂ අවධානය යොමු කරවනු ලැබේ.

(අ) ප්‍රක්ෂේපිත අරමුදල් ප්‍රවාහ තොරතුරු ඉදිරිපත් කිරීම

(ආ) කළමනාකරණ තොරතුරු පද්ධතිය

(ඇ) ආපසු ගැනීම් සඳහා භාරකරුවන්ගේ අනුමැතිය

(ඈ) භාරකාර අරමුදලේ රැස්වීම් ක්‍රමවත්ව පැවැත්වීම

(ඉ) ප්‍රතිලාභීන් සහ වෙනත් රාජ්‍ය ආයතන වෙත රඳවා ගත් අතිරික්ත අරමුදල් සමාලෝචනය කිරීම

(ඊ) ලාභාංශ බෙදා දීම

(උ) මාරු කිරීම් සඳහා ප්‍රතිලාභීන්ගේ අවධානය ලබා ගැනීම